# MCQ

Scanned by CamScanner

01. රික්තක ප්ලාස්කුවක් සාමාන්‍යයෙන් නිපදවනුයේ රිදී ආලේපිත ද්විත්ව වීදුරු බිත්ති අතර ඇති හිඩැස තුළ රික්තයක් ඇති කිරීමෙනි. ප්ලාස්කුවක් තුළ ඇති ද්‍රව්‍යයත්, පිටත පරිසරයත් අතර තාප හුවමාරුව අඩු කිරීමට මෙම රිදී ආලේපය සහ රික්තය හේතු වෙයි. රිදී ආලේපනය සහ රික්තයක් ඇති කිරීම මගින් අවම කිරීමට උත්සාහ කරන තාප හුවමාරු වීමේ ආකාර මොනවාද?

01) රිදී ආලේපනය - සන්නයනය, රික්තය - සංවහන
02) රිදී ආලේපනය - සංවහනය, රික්තය - විකිරණය
03) රිදී ආලේපනය - විකිරණය, රික්තය - සන්නයනය
04) රිදී ආලේපනය - සංවහනය, රික්තය - විකිරණය
05) රිදී ආලේපනය - සන්නයනය, රික්තය - විසරණය

02. ඔබගේ විදුලි ඉස්තිරික්කයට විදුලිය සැපයෙන සෑම අවස්ථාවකදීම මිහිකාන්දු පරිපථ කඩනය (earth leaking trip) මගින් විදුලි සැපයුම විසන්ධි වන බව පෙනුණි. මෙවැනි අවස්ථාවකදී ඔබ කළ යුත්තේ,

01) අඩු සංවේදී මිහිකාන්දු පරිපථ කඩනයක් සවි කිරීමයි.
02) ඉස්තිරික්කයෙහි හෝ සම්බන්ධකවල හෝ කාන්දුවීම් ඇත්දැයි පරීක්ෂා කිරීමයි.
03) විදුලි පරිපථයේ, මිහිකාන්දු පරිපථ කඩනය ගලවා ඉවත් කිරීමයි.
04) ඉස්තිරික්කයට සම්බන්ධ කර ඇති භූගත වයරය (earth wire) විසන්ධි කිරීමයි.
05) විදුලි පේනුවට සම්බන්ධ කර ඇති භූගත වයරය විසන්ධි කිරීමයි.

03. රූපයෙහි දක්වා ඇති සෘජුකෝණාස්‍ර හැඩැති ස්ටූලය (stool) සකස් කිරීමේ අඩුපාඩු නිසා, එහා මෙහා වැනෙන ස්වභාවයක් පවතී. A,B,C,D,E,F,G සහ H එහි ශීර්ෂ වේ. එහි මතුපිට කොටස (ABCD) ලෑලිවලින්ද සෙසු කොටස් දඬුවලින් ද සකස් කර ඇත. ඔබ වෙත ලණු කැබැල්ලක ලබා දෙන්නේ නම්, ස්ටූලය වඩාත් ශක්තිමත් කිරීම සඳහා කළ යුත්තේ,




01) එකිනෙක සම්බන්ධ වන ශීර්ෂ හොඳින් බැඳීමයි
02) එහි ආතති දඬු සම්බන්ධ වන ස්ථාන හොඳින් බැඳීමයි.
03) එකම සිරස් රේඛා මත පිහිටි ශීර්ෂ යුගළ එකිනෙක හොඳින් බැඳීමයි.
04) පාද මධ්‍යලක්ෂ්‍ය සියල්ල සම්බන්ධ වන සේ වටා හොඳින් බැඳීමයි.
05) විකර්ණ ඔස්සේ පවතින ප්‍රතිවිරුද්ධ ශීර්ෂ යුගළ එකිනෙක හොඳන් එකට බැඳීමයි.

04. ගැල්වනයිස් කිරීම යනු යකඩ හා වානේ භාණ්ඩ මල බැඳීමෙන් ආරක්ෂා කිරීම සඳහා තුත්තනාගම් තට්ටුවක් යෙදීමයි. පහත ප්‍රකාශවලින් සත්‍ය නොවන්නේ,

01) ද්‍රව තුත්තනාගම් තුළ ගිල්වීමෙන් ගැල්වනයිස් කළ හැකිය යන්නයි.
02) සින්ක් සල්ෆේට් ද්‍රාවණය තුළ විද්‍යුත් ආලේපනය මගින් කළ හැකිය යන්නයි.
03) තුත්තනාගම් ලෝහ කුඩු මතුපිට තවරා පිළිස්සීමෙන් කළ හැකිය යන්නයි.
04) විද්‍යුත් රසායනික ශ්‍රේණියේ යකඩ හා තුත්තනාගම්වල පවත්නා පිහිටීම අනුව ආරක්ෂිත ක්‍රමයක් යොදා ගැනීම කළ හැකිය යන්නයි.
05) මතුපිට පෘෂ්ඨය මත සීරීමක්, මල බැඳීම වැඩි කිරීමට හේතුවේ යන්නයි.

05. ජීව වායුව නිපදවීමේ සහ නාගරික කසළ බැහැර කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් සඳහා නිර්වායු (anaerobic) ජීර්ණ ඒකයක් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ පවත්වාගෙන යාමට අදාළව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

01) මෙම කාර්ය සඳහා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කිසිම දැනුමක් අවශ්‍ය නැත.
02) එහි සාර්ථකත්වය සඳහා බලපානුයේ සමාජයීය සාධක නොව දෘඩ තාක්ෂණය පමණි
03) නිර්වායු ජීර්ණ ක්‍රියාවලිය වටහා ගත හැකි එහෙත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දැනුමක් නොමැති ඕනෑම ජීව විද්‍යාඥයෙකුට මෙය කළ හැකිය.
04) මේ සඳහා බල ශක්ති භාවිතය අත්‍යවශ්‍ය ය.
05) මේ සඳහා ජීව විද්‍යාව,ඉංජිනේරු විද්‍යාව සහ කළමනාකරණ පුහුණුව පිළිබඳ සාමාන්‍ය දැනුමක් අවශ්‍යය


Scanned by CamScanner

03) විදුලි ශක්තිය සහ චුම්බක ශක්තිය

04) යාන්ත්‍රික ශක්තිය සහ රසායනික ශක්තිය

05) විභව ශක්තිය සහ චාලක ශක්තිය

07. පාසල් පරිශ්‍රය තුළ පිහිටි, වෘත්තාකාර හැඩයෙන් යුත් මිදුලක විෂ්කම්භය මැනීම ගුරුවරයා විසින් වෙන් වෙන්ව සිසුන් හයදෙනෙකු වෙත පවරනු ලැබිය. එම සිසුන් හයදෙනා විසින් වාර්තා කරන ලද පිළිතුරු වනුයේ මීටර 1.51 මීටර 1.49, මීටර 2.50ඊ මීටර 1.49 සහ මීටර 1.50 ය. විෂ්කම්භය සොයා ගැනීමේ පහත දැක්වෙන ක්‍රම අතුරෙන් පිළිගත නොහැකි ක්‍රමය වනුයේ,

01) මිනුම් හයෙහි සාමාන්‍ය අගය ගණනය කිරීම ය.

02) මීටර 2.5 අගය ඉවත් කර ඉතිරි අගයන්හි සාමාන්‍යය ගණනය කිරීම ය.

03) මීටර 2.5 අගය ඉවත් කර වැඩි අගයන් 2ක් සහ අඩු අගයන් 2 ඇති මීටර 1.5 අගය තෝරාගැනීමය.

04) පිළිතුරු ලෙස දෙදෙනෙක් වාර්තා කර ඇති මීටර 1 : 49 අගය තෝරා ගැනීමය.

05) මීටර 2.5 අගය ඉවත් කර සෙසු එක් එක් අගයන්හි වර්ගයන් එකතු කර ලැබෙන පිළිතුරෙහි වර්ගමූලය ගැනීමය.

08. විවිධ වානේ වර්ග සඳහා නොගැළපෙන ගති ලක්ෂණය සහ භාවිතය ඇතුළත් යුගළය පහත සඳහන් අතුරෙන් තෝරන්න.

01) ඉහළ අපහාරකතාව (high coercivity) - ස්ථිර චුම්බක

02) පහළ අපහාරකතාව (low coercivity) - විද්‍යුත් චුම්බක

03) ඉහළ අපහාරකතාව (high coercivity) - බෝල්ට් ඇණ

04) උසස් ආතතික ශක්තිය - පියානෝ වර්ගය

05) ඉතා මෘදු - රෝලර් සහ බෝල බෙයාරිම (roller and ball bearing)

09. ඔබවෙත සිහින් කෝටු යම් ප්‍රමාණයක් සහ නියත දිගින් යුතු ලණුකැබැල්ලක් ලබාදී ඇත. දී ඇති ලණු කැබැල්ල භාවිත කර වැඩිම කෝටු ප්‍රමාණයක් එකට ගැට ගැසිය හැකි ක්‍රමය දක්වන රූපය තෝරන්න. (රූපයේ පෙන්වා ඇත්තේ විවිධාකාර ලෙස කෝටු එකට බැඳි පසු පෙනෙන හරස්කඩ කිහිපයකි. රූප සටහන් ඇඳ ඇත්තේ පරිමාණයට නොවේ.)



(1) (2) (3) (4) (5)

10. අදාළ ක්‍රියාවලිය හා නොගැළපෙන ද්‍රව්‍ය අඩංගු පිළිතුර කුමක්ද?

01) වාත්තු කිරීම (casting) - කොන්ක්‍රීට්, විනවර්ට්, ප්ලාස්ටික්

02) බොරදම් ගෑම (moulding) - රබර්, ප්ලාස්ටික්

03) පිඹීලීම (blowing) - වීදුරු බට, වානේ, පිඟන් මැටි

04) යන්ත්‍රකර්මය (machining) - වානේ, දැව

05) පිරි ගෑම (filing) - ඇලුමිනියම්, වානේ

11. වර්ෂාපතනය නිවැරදිව මැන ගැනීම සඳහා වඩාත් සුදුසු උපකරණය කුමක්ද?



(1) (2) (3) (4) (5)



Scanned by CamScanner

12. ගොඩනැගිලිවල ජනේල රාමු සඳහා දැව සහ ඇලුමිනියම් භාවිතයේ දී ඇතිවන වාසි සහ අවාසි සංසන්දනය කිරීමේදී වියදමට අමතරව සලකා බැලිය යුතු තවත් සාධක ගණනාවක් ඇත. පහත දැක්වෙන ඒවා අතුරෙන් එවැනි සංසන්දනයක දී අදාළ නොවන සාධකය කුමක්ද?

01) කල්පැවැත්ම　02) මතුපිට ආරක්ෂිත පටලයක් ඇති කිරීමේ හැකියාව
03) සෞන්දර්ය　04) චුම්බක ගුණ　05) යාන්ත්‍රික ශක්තිය

13. ආහාර සංරක්ෂණයට යොදාගත හැකි ක්‍රමයක් නොවන්නේ,

01) වියළීමය　02) ශීතකරණයක තැබීමය　03) ලුණු දැමීමය.
04) මුහුන් භාවිතය (Culturing)
05) කාමර උෂ්ණත්වය තුළ ඉහළ ආර්ද්‍රතාවකින් යුතු වාතයට (humid air) විවෘතව තැබීම ය.

14. වල්කනයිස් කිරීම රබර් කර්මාන්තයේ දී වැදගත් වන්නේ,

01) ගුණාත්මකව, කාර්මිකව ප්‍රයෝජනවත් නිපැයුමක් ඇති කරන නිසාය.
02) ක්‍රියාකාරිත්වයට අවශ්‍ය තාප ප්‍රමාණය අඩු කරන නිසාය.
03) පහසු ප්‍රතිවර්තන ක්‍රමයක් නිසාය.　04) කිසිම රසායනික වෙනස්වීමකට සම්බන්ධ නොවන නිසාය.
05) පසුගිය වසර කිහිපය තුළ සොයා ගනු ලැබූ නව ක්‍රමයක් නිසා ය.

15. යන්ත්‍රයක හෝ හැටුමක (structure) හෝ කොටස් ඒවාට නියමිත ක්‍රියාකාරී ස්ථානවලට සම්බන්ධ වන ආකාරය එකලස් චිත්‍ර (assembly drawing) මගින් නිරූපණය කරයි. එකලස් චිත්‍ර සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරෙන් අසත්‍ය ප්‍රකාශය කුමක්ද? එකලස් චිත්‍රය මගින් පෙන්වනුයේ,

01) නිෂ්පාදනයෙහි සම්පූර්ණ හැඩයය.　02) පිටින් පිට මිනුම් ය.
03) එක් එක් කොටසට අදාළ ස්ථානය.　04) විවිධ කොටස් අතර ක්‍රියාකාරී සම්බන්ධතාව ය.
05) එක් එක් කොටසෙහි විස්තරාත්මක මිමිය.

16. කුඩා නිවසක වහල තාප්පයක් රූප සටහනෙහි දක්වා ඇත. වහලයේ බර සමමිතිකව කාප්පය මත ක්‍රියාකරන විට PQ හා PR කොටස්වල ඇතිවනුයේ,




01) පිළිවෙලින් සම්පීඩක සහ ආතති බලයයන් ය.
02) පිළිවෙලින් ආතති සහ සම්පීඩක බලයයන් ය.　03) පිළිවෙලින් සම්පීඩක සහ ව්‍යාකෘතිබලයයන් ය.
04) දෙකෙහි ම ආතති බලයයන් ය.　05) දෙකෙහි ම සම්පීඩක බලයයන් ය.

17. නව මාර්ගයක් සැකසීමේදී යටි පාදකය (sub-base course) සුසංහසනය (compact) සඳහා රෝලර යොදාගනී.

A- එක සමාන ප්‍රමාණයෙන් යුත් සමහාරක (aggregates) අඩංගු ද්‍රව්‍යවලින් යටි පාදකය සමන්විතය.
B- විවිධ ප්‍රමාණයන්ගෙන් වර්ග වී ඇති සමාහාරක අඩංගු ද්‍රව්‍යවලින් යටි පාදකය සමන්විතය.
C- මාර්ගය මතුපිටට වැටෙන වැසි ජලය උරාගෙන පෙරන මාධ්‍යයක් ලෙස යටි පාදකය ක්‍රියාකළ යුතුය.
D- වානේ ඩ්‍රම් රෝලක් භාවිත කිරීමෙන් යටි පාදකය ඵලදායී ලෙස සුසංහසනය කළ හැකිය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

01) A සහ B පමණි　02) A සහ C පමණි　03) A සහ D පමණි
04) B සහ C පමණි　05) B සහ D පමණි

18. රූපයේ දක්වනුයේ කපන ලද පස් කන්දකට රැඳවුම් බිත්තියක් ඉදිකර ඇති ආකාරයයි.




A- R බොරළු සහිත වැලි වැනි පාරගම්‍ය ද්‍රව්‍යවලින් සකස් විය යුතුය.
B- අත්තලනයක් (hand-tamper) හෝ තල කම්පනයක් (plate vibrator) හෝ භාවිත කිරීමෙන් R ද්‍රව්‍ය සුසංහසනය කරයි.
C- S මැටි සහිත අපරාගම්‍ය ද්‍රව්‍යයක් විය යුතුය.
D- T සිදුරු සහිත PVC නලයක් විය යුතුය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

01) A,B සහ C පමණි　02) A,B සහ D පමණි
03) A,C සහ D පමණි　04) B,C සහ D පමණි　05) A,B,C සහ D යන සියල්ලම



Scanned by CamScanner

19. රූපයේ දැක්වෙන්නේ ගෘහස්ථ පූතික වැංකියක
ඡේදිය හරස්කඩකි.




A- පල්දෝරු ජලය ගැලීම P සිට Q දිශාවටය.
B- R උඩුමණ්ඩි ජලය මත පාවෙයි.
C- S ජලය වර්ග කළ පෙරනයක් හරහා උරාගැනී
වළට (soakage pit) ගමන් කරයි.
D- S ජලය මතුපිට කානුවක්වෙත ද ගලා යාමට
සැලැස්විය හැකි ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

01) A සහ B පමණි 02) A සහ C පමණි
03) B සහ C පමණි 04) B සහ D පමණි 05) A,C සහ D පමණි

20. PVC නළ උපාංග ගෘහස්ථ ජල නළ පද්ධති සඳහා යොදා ගනී.
A- පිටත පොට සහිත නාන මලක් සවිකිරීම සඳහා සරාම් වැලමිට නැමීමක් (faucet elbow) යොදා ගනී.
B- අසමාන විෂ්කම්භවලින් යුත් PVC නළ 02 මුට්ටු කිරීමට සාමාන්‍ය කොවෙනියක් (plain socket) යොදා ගනී.
C- 1" PVC නළය හඳුන්වන්නේ 32mm PVC නළය වශයෙනි
D- PVC නළ වර්ගය 1000 යන්නෙන් අදහස් කෙරෙන්නේ නළය ඔරොත්තු දෙන පීඩනය කිලෝපැස්කල් 1000 බවය.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

01) A,B සහ C පමණි 02) A,B සහ D පමණි 03) A,C සහ D පමණි
04) B,C සහ D පමණි 05) A,B,C සහ D යන සියල්ලම

21. නීතිරීති අනුව, ඉඩමක දෙමහල් නිවසක් ඉදිකිරීමේ දී නිවස පිටුපස සම්පූර්ණ පළලට විහිදෙන පළල මීටර 3කට නොඅඩු විවෘත ප්‍රදේශයක් තිබිය යුතුය. පිටුපස විවෘත ප්‍රදේශයට යාව පළල මීටර 6කට අඩුපාරක් තිබේ නම්, ඉහත සඳහන් පළල ප්‍රමාණය මීටර 2.25ට නොඅඩු විය යුතුය. මෙම නීතිය ක්‍රියාත්මක වනුයේ,

01) කැළිකසළ රථයට ඉඩම තුළට ඇතුළුවීමට ඉඩ ලබා දීමටය.
02) ඉඩම තුළට ගිනි නිවන රථයට ඇතුළුවීමට ඉඩකඩ ලබාදීමටය.
03) නිවසෙහි පල්දෝරු නළය ප්‍රධාන පල්දෝරු නළයට සම්බන්ධ කිරීමේ කාර්යයටය.
04) නිවසට අදාළ පූතික වැංකිය (septic tank) සහ උරාගැනීමේ වළ (sookage pit) සකස් කිරීමට අවශ්‍ය ඉඩකඩ ලබා ගැනීමටය.
05) නිවසට ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා දීමටය.

22. ගොඩනැගිලි නීතිරීති අනුව, ආලෝකය සහ වාතාශ්‍රය ලබාදීමට යොදා ගන්නා ජනේල, සම්මත ආලෝක තලයට විවෘත විය යුතු අතර එම ආලෝක තලය පැන්නුම මීටර 1 කට නොවැඩි වහල අගුවකින් හෝ හිරු ආවරණයකින් හෝ හැර වෙනත් බාධාවකින් තොරව අහසය විවෘතව තිබිය යුතුය. රූපයෙහි පෙන්වා ඇති ආලෝක තලය දක්වන a කෝණයෙහි අගය විය යුත්තේ,




01) 44.5° කි. 02) 60° කි. 03) 63.5° කි.
04) 72.5° කි. 05) 80° කි.

23. වහලයක අගුවෙහි විස්තර රූපයෙහි දක්වා ඇත. P- සිවිලිම් තලාදය Q- පරාලය R- වඩිම්බු ලෑල්ල S-අගුපීල්ල




A- Q පරාලය බිත්ති මත රදා සිටී
B- R වඩිම්බු ලෑල්ල සාමාන්‍යයෙන් Q හා සම්බන්ධ කෙරේ.
C- Q පරාලය රදවා ඇත්තේ P මතය.
D- R වඩිම්බු ලෑල්ල අගුව දිගටම යොදා ඇත.

01) A,B සහ C පමණි 02) A,B සහ D පමණි
03) A,C සහ D පමණි 04) B,C සහ D පමණි 05) A,B,C සහ D යන සියල්ලම



Scanned by CamScanner

24. වැසි ජලය බැසයන කානුවක් මතුපිට කොන්ක්‍රීට් ලෑලි යොදා ආවරණය කර ඇත. එහි වැරගැන්වුම් යෙදිය යුතු නිවැරදි ආකාරය රූපය කුමක්ද?




25. අභ්‍යන්තර දහන එන්ජිමක උපාංග පහත රූපයේ දක්වා ඇත. P, Q සහ R මගින් දක්වනු ලබන උපාංග වන්නේ පිළිවෙලින්,




01) පිස්ටනය, සම්බන්ධි දණ්ඩ සහ දඟර කඳ ය.
02) සිලින්ඩර හිස, සම්බන්ධක දණ්ඩ සහ දඟර කඳ ය.
03) පිස්ටනය, සිලින්ඩරය සහ ප්‍රධාන බෙයාරිම ය.
04) සිලින්ඩර හිස, පිස්ටනය සහ දඟර කඳ ය.
05) පිස්ටනය, සම්බන්ධක දණ්ඩ සහ ජව රෝද ය.

26. පහත උපාංග අතුරෙන් සම්පීඩන දහන (compression ignition) එන්ජිමකට අත්‍යවශ්‍ය වන උපාංගය කුමක්ද?

01) ඉන්ධන විදිනය (fuel injector)
02) කාබියුරේටරය (carburetor)
03) අවකරණය (throttle body)
04) පුළිඟු පේනුව (spark plug)
05) ඩිස්ට්‍රිබියුටරය (distributor)

27. Backhoe යන්ත්‍රයක් රූප සටහන මගින් දක්වා ඇත. f මගින් දක්වනු ලබන බකට්ටුව එහි උපරිම උසට ගෙනයාමට හයිඩ්‍රොලික් සිලින්ඩර a හා c චලනය කළ යුතු ආකාරය වනුයේ,




01) සිලින්ඩර c හා a යන දෙකම හැකිලීම ය.
02) සිලින්ඩර c හැකිලීම හා සිලින්ඩර a දිගු කිරීම ය.
03) සිලින්ඩර දෙකම දිගු කිරීම ය.
04) සිලින්ඩර c දිගු කිරීම හා සිලින්ඩර a හැකිලීම ය.
05) සිලින්ඩර a හැකිලීම හා සිලින්ඩර c අර්ධ වශයෙන් දිගු කිරීමය.

28. හයිඩ්‍රොලික් සිලින්ඩර e මගින් සිදු කෙරෙන කාර්යය වනුයේ,

01) බාහුව (d) පාලනය කිරීම ය.
02) බකට්ටුව (f) පාලනය කිරීම ය.
03) බාහුව (b) සමතුලිත කිරීම ය.
04) හයිඩ්‍රොලික් සිලින්ඩරයට (c) ආධාර පිණිස ය.
05) අමතර ආධාරකයක් (reserve element) ලෙස ක්‍රියාකිරීමය.

29. අභ්‍යන්තර දහන එන්ජිමක (internal combustion engine) පහර 3 ක් රූප සටහනින් දැක්වේ. P, Q හා R මගින් දක්වන පහරවල් වන්නේ, පිළිවෙලින්,




01) චූෂණ පහර, බල පහර, සම්පීඩන පහර ය.
02) චූෂණ පහර, බල පහර, පිටාර පහර ය.
03) චූෂණ පහර, සම්පීඩන පහර, බල පහර ය.
04) චූෂණ පහර, සම්පීඩන පහර, පිටාර පහර ය.
05) පිටාර පහර, චූෂණ පහර, බල පහර



Scanned by CamScanner

30. අභ්‍යන්තර දහන එන්ජිමක චූෂණ වෑල්වය හා පිටාර වෑල්වය ක්‍රියාකරවීමට සැලගිල්ල (rocker arm) භාවිත කරනු ලැබේ. සැලගිල්ල ක්‍රියාකරවනු ලබන්නේ,

01) දඟර කඳ මගිනි 02) ජව රෝදය මගිනි 03) සම්බන්ධක දණ්ඩ මගිනි
04) කැම් යාන්ත්‍රණ මගිනි 05) පිස්ටනය මගිනි.

31. ඩීසල් පෝෂණ පොම්පයක (diesel fuel injection pump) ප්‍රධාන කාර්යය වනුයේ,

01) චූෂණ පහර තුළ දී ඉන්ධන චූෂණ මග (intake manifold) තුළට විදීමයි.
02) ඉන්ධන, දහන කුටීරය (combustion chamber) තුළට විදීමයි.
03) ඉන්ධන විදිනය (injector) විවෘත කර ඉන්ධන විදීමයි.
04) නිවැරදි ප්‍රමාණයක ඉන්ධන නිවැරදි වේලාවට දහන කුටීරයට විදීමයි.
05) ඉන්ධන සිලින්ඩර අතර බෙදාහැරීම හා ඉන්ධන ජ්වලනය කිරීමයි.

32. බීකරයක අඩක් ජලයෙන් පිරී ඇති අතර නිදහසේ පාවෙන ඝන වස්තුවක් P ජලය මත තබා තිබේ. ජලය සමග මිශ්‍ර නොවන Q නම් ද්‍රවයක් එම බීකරයට එකතු කරන ලද අතර, එය ජලය මත පාවෙන බව නිරීක්ෂණය විය. එවිට P වස්තුව ජලය හා ද්‍රව්‍ය අතර පාවේ. ජලයේ ඝනවස්තුවේ හා ද්‍රවයේ ඝනත්වයන් පිළිවෙලින් $p_w, p_P, p_Q$ නම් ඒවා අතර නිවැරදි සම්බන්ධතාව පෙන්නුම් කරන පිළිතුර කුමක්ද?

01) $p_w < p_P < p_Q$ 02) $p_w > p_P > p_Q$ 03) $p_w < p_P < p_Q$
04) $p_w > p_P < p_Q$ 05) $p_w > p_P < p_Q$

33. පහත ප්‍රස්තාර අතුරෙන් කාල ප්‍රමාදය (dead time) නිවැරදිව දැක්වෙන ප්‍රස්තාරය කුමක්ද?



(1) (2) (3) (4) (5)

34. වෑල්ඩින් සම්බන්ධ ප්‍රකාශය කිහිපයක් පහත දැක්වේ.

A- ඝන තහඩු පෑස්සීමේදී වායු වෑල්ඩින් ක්‍රමය භාවිත කළ හැකිය.
B- වෑල්ඩින් කිරීමේදී ලෝහ තහඩුවල දාර සුදුසු ආකාරයට සකස් කිරීම (edge preparation) අවශ්‍යය.
C- වායු වෑල්ඩින් (gas welding) ක්‍රමයේදී ඔක්සිජන් හා ඇසිටලින්වල සංයෝගය දැල්ලෙහි උෂ්ණත්වය කෙරෙහි බලපායි.
D- ඔක්සිජන් සිලින්ඩරය දකුණු අත් පොටවලින් (righthand threads) යුක්ත වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

01) A සහ B පමණි
02) B සහ D පමණි
03) A,B සහ C පමණි
04) A,B සහ D පමණි
05) A,B,C සහ D යන සියල්ලම

35. භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් දී ඇති පහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

01) වෑල්ඩින් ක්‍රියාවලියේදී විශේෂ ආරක්ෂක ක්‍රම අවශ්‍ය නොවේ.
02) මිලින් යන්ත්‍රය (milling machine) මගින් සිලින්ඩරාකාර උපාංගයක පොට කැපීම සිදුකළ හැකිය.
03) වාත්තු ක්‍රමයේදී විශේෂ අච්චු (moulds) අවශ්‍ය නොවේ.
04) ලෝහ හැඩ තැලීම් ක්‍රමයේ දී එහි අභ්‍යන්තර සැකැස්මෙහි (grain structure) වෙනසක් සිදු නොවේ.
05) ලේත් යන්ත්‍ර (lathe machine) ආධාරයෙන් සිලින්රාකාර උපාංගයක පොට කැපීම සිදුකළ හැකිය.


Scanned by CamScanner

36. යන්ත්‍රයක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණ / කරුණු පහත දී ඇති කරුණු තුළින් තෝරන්න.

A- ක්‍රියාකරුගේ ශරීර ප්‍රමාණය හා චලිත සීමාවන් අනුව එම යන්ත්‍රය හැසිරවීමට ඇති හැකියාව

B- ක්‍රියාකරු හා යන්ත්‍රය අතර ඇති අතුරු මුහුණත සැලසුම් කිරීමේදී පැන නගින විෂමතා

C- ආසනවල හා වැඩ ස්ථානවල (work station) ජ්‍යාමිතික ප්‍රමාණ

D- පාලන උපාංගවල (control knobs) පිහිටීම

| | | |
|---|---|---|
| 01) A පමණි | 02) A සහ B පමණි | 03) A,B සහ C පමණි |
| 04) B,C සහ D පමණි | 05) A,B,C සහ D යන සියල්ලම | |

37. රූපය මගින් යාන්ත්‍රික තරාදියක් දක්වා තිබේ. නිවැරදි මිනුමක් ලබාගැනීම සඳහා බර මැනිය යුතු වස්තුව තැබිය යුතු ස්ථානය හා සමතුලිත බර (balancing weight තැබිය යුතු ස්ථානය නිවැරදිව දක්වනු ලබන්නේ,




A- වස්තුව A හි දී හා සමතුලිත බර D හිදී ය.

B- වස්තුව B හිදී හා සමතුලිත බර D හිදීය.

C- වස්තුව C හිදී හා සමතුලිත බර A හිදී ය.

D- වස්තුව D හිදී හා සමතුලිත බර B හිදී ය.

| | | |
|---|---|---|
| 01) A සහ B පමණි | 02) A සහ D පමණි | 03) B සහ C පමණි |
| 04) B සහ D පමණි | 05) C සහ D පමණි | |

38. ලෝහ භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී සමහර භාණ්ඩ රත් පිළියම් (heat treatment) කරනු ලැබේ. රත් පිළියම් කිරීම මගින් බලාපොරොත්තු වන ප්‍රධාන කාර්ය වනුයේ,

01) තාපය, වීගයින් අවට පරිසරයට මුදා හැරීමයි.

02) භාණ්ඩයට සුදුසු වර්ණයක් ලබා දීමයි.

03) උෂ්ණත්වය පරීක්ෂා කිරීමයි.

04) දෘඩතාව (hardness) අවශ්‍ය පමණට වැඩි කිරීමයි.

05) නිෂ්පාදන දෝෂ පරීක්ෂා කිරීමයි.

39. රෙගියුලේටරය (regulator) විදුලි පංකාවල භාවිත වන උපාංගයකි. පහත ප්‍රකාශ අතුරෙන් එහි කාර්යය දක්වන ප්‍රකාශ තෝරන්න.

A- රෙගියුලේටර මගින් විදුලි පංකාවේ වේගය පාලනය කළ හැක

B- රෙගියුලේටර සංවෘත පුඩු පාලන පද්ධතියකට උදාහරණයකි

C- රෙගියුලේටර මගින් විදුලි පංකාවේ මෝටරයට යන විදුලි ප්‍රමාණය පාලනය කළ හැකිය.

D- රෙගියුලේටරය විවෘත පුඩු පාලන පද්ධතියෙහි කොටසකි.

| | | |
|---|---|---|
| 01) A,B සහ C පමණි | 02) A,B සහ D පමණි | 03) A,C සහ D පමණි |
| 04) B,C සහ D පමණි | 05) A,B,C සහ D යන සියල්ලම | |




40.. ඉහත රූපයෙහි දැක්වෙන M වස්තුවෙහි ස්කන්ධය (වාතයේ දී) 9kg වේ. එම වස්තුව රූපයේ දැක්වෙන පරිදි ජල භාජනයේ ගිල්වූ විට S- පරිමාණයෙන් දැක්වෙන පාඨාංකය වන්නේ, (M වල විශිෂ්ට ගුරුත්වය 1.5 ලෙස සලකන්න.)

| | | |
|---|---|---|
| 01) 1.5kg | 02) 3kg | 03) 6kg |
| 04) 9 kg | 05) 12kg | |



Scanned by CamScanner

41. P - N සන්ධියක P - පෙදෙසේ හා N - පෙදෙසේ ඇති [illegible]

01) කුහර හා ඉලෙක්ට්‍රෝනය
02) ඉලෙක්ට්‍රෝන හා කුහර ය.
03) ඉලෙක්ට්‍රෝන හා ඉලෙක්ට්‍රෝන ය.
04) සෘණ ආරෝපණ හා ධන ආරෝපණ ය.
05) ධන ආරෝපණ හා සෘණ ආරෝපණය.

42. බල වර්ධක පරිපථයක ප්‍රදානයට 100Hz සයිනාකාර තරංගයක් ලබා දුන් විට නිරීක්ෂණය කළ ප්‍රතිදාන තරංග ආකාරය රූපයෙහි දැක්වේ. මෙම වර්ධකයේ පන්තිය කුමක්ද?




01) A පන්තිය
02) B පන්තිය
03) C පන්තිය
04) D පන්තිය
05) AB පන්තිය

43. රූපයෙහි දැක්වෙන පරිපථයේ යොදාගෙන ඇති නැඹුරු කිරීමේ ක්‍රමය කුමක්ද?




01) ස්ථිර නැඹුරුව
02) ස්වයං නැඹුරුව
03) සංග්‍රාහක ප්‍රතිපෝෂණ නැඹුරුව
04) විමෝචක ප්‍රතිපෝෂණ නැඹුරුව
05) විභව බෙදුම් නැඹුරුව

44. රූපයෙහි දැක්වෙන පරිපථයේ වෝල්ටීයතා ලාභය 2 කි. පහත දැක්වෙන පිළියම් වලින් කවරක් එම අගය 4 දක්වා වෙනස් කිරීමට යොදා ගත හැකිද?




01) R1 හි අගය 200 kΩ දක්වා වැඩි කිරීම
02) R2 හි අගය 100kΩ දක්වා අඩු කිරීම
03) R1 හි අගය 50kΩ දක්වා අඩු කිරීම
04) R1 හි අගය 50kΩ දක්වා අඩුකර R2 හි අගය 100kΩ දක්වා අඩු කිරීම.
05) R1 හි අගය 50kΩ දක්වා අඩු කර R2 හි අගය 300kΩ දක්වා වැඩි කිරීම

45. රූපයෙහි දැක්වෙන තාර්කික ද්වාරයේ බූලියානු ප්‍රකාශනය වන්නේ,




01) $Q = A + B$
02) $Q = \overline{A.B}$
03) $Q = \overline{A.B}$
04) $Q = \overline{A + B}$
05) $Q = A \oplus B$

46. විසර්ජනය වීමේ වේගය කුමක් වුවත් බැටරියක සම්පූර්ණ ආරෝපණය එහි සාමාන්‍ය විභවය යටතේ තිබේ යැයි උපකල්පනය කළහොත් සම්පූර්ණයෙන් ආරෝපණය වී ඇති 100Ah, 12 V බැටරියකින් ලබාගත හැකි ශක්තිය කොපමණද?

01) 1.2 kWh
02) 1.44 kWh
03) 8.33 kWh
04) 12 kWh
05) 100 kWh

47. කර්මාන්ත සඳහා භාවිතා වන විදුලි බලය සඳහා අයකිරීම් කෙරෙනුයේ කොටස් 02 ක් මත පදනම් වූ අයකිරීම් ක්‍රමයක් යටතේය. එක් කොටසක් භාවිත කරන විදුලි ඒකක ගණන මත පදනම් වන අතර අනෙක් කොටස විදුලි සැපයුමක් ලබාගන්නා උපරිම kVA අගය මත පදනම් වේ. මුළු භාරය ප්‍රධාන වශයෙන් කර්මාන්ත තුළ අධික ලෙස ප්‍රේරණ මෝටර භාවිත කිරීම මත රඳා පවතී. උපරිම විදුලි භාවිතය අඩුකර ගත හැක්කේ,

01) ජව සාධකය නිවැරදි කිරීමේ ධාරිත්‍රක භාවිත කිරීමෙනි.
02) ජව සැපයුමට ප්‍රේරණ භාර සවිකිරීමෙනි.
03) ශ්‍රේණිගත ලෙස ප්‍රේරණ භාර සවිකිරීමෙනි.
04) විදුලි බුබුළු වැඩි ප්‍රමාණයක් සවිකිරීම මගින් මෝටර නිසා ඇතිවන බලපෑම ඉවත් කිරීමෙනි.
05) උපරිම විදුලි බලය යටතේ සෑම විටම ක්‍රියා කිරීමෙනි.



Scanned by CamScanner

48. ප්‍රතිරෝධකයක් ප්‍රේරකයක් හා ධාරිත්‍රකයක් ශ්‍රේණිගතව සම්බන්ධ කර ඇති සරල පරිපථයකට පයිනාකාර වෝල්ටීය සැපයුමක් මගින් ජවය ලබාදී ඇති ආකාරය රූපයෙන් දැක්වේ. AB අතර විභවාන්තර හා AC අතර විභවාන්තරය දෝලනේක්ෂයක් (Os- cilloscope) මගින් නිරීක්ෂණය කළ විට ඒවා සමපාත බව නිරීක්ෂණය කල හැකි විය. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් අසත්‍ය වේද?




01) වෝල්ටීයතා සැපයුමෙන් ලබාදෙන වෝල්ටීයතාව හා ධාරව සමකලාස්ථ වේ.
02) ප්‍රතිරෝධකයේ හා ප්‍රේරකයේ සම්බාධන අගයන් විශාලත්වයෙන් සමාන වන අතර ධාරිත්‍රකයේ එම අගය ශූන්‍ය වේ.
03) ප්‍රේරකයේ හා ධාරිත්‍රකයේ සම්බාදන අගයයන් විශාලත්වයෙන් සමාන වේ.
04) B සහ C අතර විභවාන්තරය ශූන්‍ය වේ.
05) ප්‍රේරකය හරහා සහ ධාරිත්‍රකය හරහා විභවාන්තර විශාලත්වයෙන් සමාන වේ.

49. විදුලි බුබුලක් ස්ථාන දෙකක සිට (උදා: පඩිපෙළක දෙකෙළවරෙහි දැල්වීමට හා නිවීමට අවශ්‍ය වූ විට ඒ සඳහා ස්විච්ච් දෙකක් සම්බන්ධ කළ හැකි ආකාරය රූපයෙහි දැක්වේ. වම්පස ඇති ස්විචය මගින් A අග්‍රය B අග්‍රයට හෝ C අග්‍රයට හෝ සම්බන්ධ කළ හැකි ය. දකුණු පස ඇති ස්විචය මගින D අග්‍රය B අග්‍රයට හෝ C අග්‍රයට හෝ සම්බන්ධ කළ හැකිය. මෙය සවි කිරීම හා සම්බන්ධ පහත කවර ප්‍රකාශයක් සත්‍ය වේද?




01) රූපයේ දැක්වෙන ස්විච 02 ම Double Pole Singe Throw (DPST) වර්ගයේ ඒවා ය.
02) B හා C අග්‍ර සාමාන්‍යයෙන් ප්‍රධාන ජව සැපයුමට සම්බන්ධ වන අතර A හා D අග්‍ර විදුලි බුබුලට සම්බන්ධ කළ හැක.
03) A හා D අග්‍ර සාමාන්‍යයෙන් ප්‍රධාන ජව සැපයුමට සම්බන්ධ වන අතර B හා C අග්‍ර විදුලි බුබුලට සම්බන්ධ කළ හැක.
04) ගෘහස්ථ විදුලි පරිපථවල භාවිත කරන ප්‍රධාන ස්විච (main switch) වෙනුවට ද මෙම සැකසුම භාවිත කළ හැක.
05) A අග්‍රය සාමාන්‍යයෙන් සජීව කම්බියට ද D අග්‍රය විදුලි බුබුලෙහි එක් අග්‍රයකට දවිදුලි බුබුලෙහි අනෙක් අග්‍ර අජීව කම්බියට ද සම්බන්ධ වේ.

50. සරල සේතු සෘජුකාරකයක් සහ සුමට කිරීමේ පෙරණයක් රූපයේ දැක්වේ. සුමට කිරීමේ පෙරණය නැතිවිට සහ ඇති විට එම පරිපථයේ ප්‍රතිදාන සංඥාවේ තරංග ආකාරය වඩා හොඳින් දැක්වෙන පිළිතුර කුමක්ද?









Scanned by CamScanner

01. ව්‍යාවර්තය (torque) මැනීමේ නිවැරදි ඒකකය තෝරන්න.

01) N 02) Nm 03) kW 04) $kgs^{-1}$ 05) $Ns^{-1}$

02. මෘදු වානේවල තිබිය හැකි කාබන් ප්‍රතිශතය කුමක්ද?

01) 0.3% 02) 1% 03) 3% 04) 4% 05) 14%

03. පාසලේ ඉවත දමන කඩදාසි තලා ඇසිරීම සඳහා යන්ත්‍රයක් සැලසුම් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන සාධක සංයෝජන, ශිෂ්‍යයින් 05කු විසින් යෝජනා කරන ලදී. ඒවායින් වඩාත් ගැළපෙන සංයෝජනය තෝරන්න.

01) යන්ත්‍රයේ පිරිවැය, ඇසුරුම් ක්‍රමය, යන්ත්‍රයේ විශාලත්වය, පන්ති කාමර සංඛ්‍යාව
02) ඇසුරුම් අනුපාතය, භාවිත ද්‍රව්‍ය යන්ත්‍රයේ බර පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව
03) ඉවත දමනු ලබන කඩදාසිවල බර, ඇසුරුම් අනුපාතය ඉවත දමන කඩදාසි එකතු කරනු ලබන වාර ගණන (සංඛ්‍යාතය) කඩදාසි එකතු කිරීමේ ක්‍රමය
04) නඩත්තු මට්ටම, යන්ත්‍රය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය සිසුන් ගණන යන්ත්‍රය භාවිත කරනු ලබන වේලාව අසුරන ලද කඩදාසි විසර්ජනය කරනු ලබන ක්‍රමය
05) ඇසුරුම් ක්‍රමය ඇසුරුම් සඳහා අවශ්‍ය බලය යන්ත්‍රයේ දිග පළල සහ උස ඇසුරුම් කුට්ටියෙහි ශක්තිය

04. වර්නියර් කැලිපරයකින් ලබාගත් මිනුමක් රූපයේ දැක්වේ. මිනුම් සඳහා වඩාත් සුදුසු කියවීම තෝරන්න.



01) 230.0 mm
02) 235.5 mm
03) 236.5 mm
04) 240.5 mm
05) 241.0 mm

05. ස්කන්ධය m වන ශිෂ්‍යයෙක් ස්කන්ධය M වන ඉණිමගක් දිගේ ඉහළ නගී. ඉණිමග මත ක්‍රියාකරන බල නිවැරදිව දැක්වෙන රූපය තෝරන්න.




(1) (2) (3) (4) (5)

06. විෂ්කම්භය 30mm වන නළයකට $4ms^{-1}$ වේගයකින් ජලය ඇතුළු වෙයි. ජල රෝදයක් කරකැවීම සඳහා මෙම ජල ධාරාවේ වේගය $20ms^{-1}$ තෙක් වැඩි කළ යුතු වෙයි. මෙහි දී ශක්ති හානියක් නොමැති නම් පිටාර නළයේ (output pipe) විෂ්කම්භය කොපමණ විය යුතුද?

01) 6mm 02) 8mm 03) 9mm 04) 10mm 05) 18mm

07. පාසල් විද්‍යාගාරයේදී යකඩ දණ්ඩක් ස්පර්ශ කරන විට ලී දණ්ඩකට වඩා සිසිල් බව ශිෂ්‍යයකුට දැනිණි. මෙම සංසිද්ධිය සඳහා වඩාත් ගැළපෙන හේතුව කුමක්ද?

01) ලී සමග සැසඳූ විට යකඩවල ඝනත්වය වැඩිවීම
02) ලී සමග සැසඳූ විට යකඩවල විද්‍යුත් සන්නායකතාව වැඩිවීම
03) ලී වලට වඩා යකඩ සක්‍රිය වීම
04) යකඩවලට වඩා ලී වල අණුක භාරය අඩුවීම
05) යකඩවලට වඩා ලී වල තාප සන්නායකතාව අඩුවීම



Scanned by CamScanner

08. පහත දැක්වෙන පරිපථ සටහනෙහි $S_1$ සහ $S_2$ ස්විච්චි සංවෘත කර ඇති (on) විට, විද්‍යුත් ධාරාවක් ගමන් නොකරන උපාංගය තෝරන්න.




01) $D_1$
02) $D_2$
03) $D_1$ 04) $D_4$ 05) $L_3$

09. වෝල්ටීයතාව 60 W වන විදුලි බල්බයක් පැය තුනක කාලයක් පුරා අඛණ්ඩව දැල්වෙමින් තිබුණි නම්, එහි ශක්ති පරිභෝජනය කොපමණද?

01) 18 kWh 02) 20 kWh 03) 180 kWh 04) 20 Wh 05) 180 Wh

10. සර්වසම බැලූන පහක් පහත වරණ යටතේ දී ඇති වායු වර්ග පහෙන් වෙන වෙන ම පුරවන ලදී. පළමුවෙන්ම ඉහළට ගමන් කරනු ඇත්තේ කවර වායු වර්ග පිරවූ බැලූනයද?

01) ඔක්සිජන් 02) හයිඩ්‍රජන් 03) කාබන්ඩයොක්සයිඩ්
04) ක්ලෝරීන් 05) නයිට්‍රික් ඔක්සයිඩ්

11. ලෝහයක් ගැල්වනයිස් කිරීමෙන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලිය යනු,

01) එය මත ඉහළ සක්‍රියතාවයෙන් යුත් ලෝහයක් ආලේප කිරීමයි.
02) එය මත උදාසීන ලෝහයක් ආලේප කිරීමයි.
03) එය මත ලෝහමය වැනි ආලේපයක් යෙදීමයි.
04) ආම්ලික ද්‍රාවණයක් ගිල්වීමයි.
05) ක්ෂාරීය ද්‍රාවණයක ගිල්වීමයි.

12. මෙම ව්‍යාප්තියේ මාතය වනුයේ,

01) A ය.
02) B ය.
03) C ය.
04) D ය.
05) E ය.




13. ශිෂ්‍යයෙක් පාසල් වැඩ පට්ටල කාමරයේ තිබී පහත සඳහන් PVC බට හා අමතර කොටස් සොයාගන්නා ලදී.

A- සෙන්ටිමීටර 5 ක අරයක් සහිත PVC බටයක් B- සෙන්ටිමීටර 2.5 ක අරයක් සහිත PVC බටයක්
C- සෙන්ටිමීටර 1.25ක අරයක් සහිත PVC බටයක් D- සෙන්ටිමීටර 5 සිට 2.5 සොකට්
E- සෙන්ටිමීටර 2.5 සිට 1.25 සොකට්

ඔහු විසින් මෙම උපාංග පහත සඳහන් අනුපිළිවෙලට සම්බන්ධ කරන ලදී.

A ⟶ D ⟶ B ⟶ E ⟶ C

මෙම පද්ධතිය තුළින් ඒකාකාර පීඩනයක් යටතේ ජලය ගලායාමට සැලැස්වූ විට වැඩිම වේගයකින් ජලය ගලා යන්නේ,

01) A නළය තුළිනි. 02) B නළය තුළිනි 03) C නළය තුළිනි
04) A හා B නළ තුළිනි 05) A හා C නළ තුළිනි

14. සූර්ය කෝෂයක් මගින්

01) තාප ශක්තිය, විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කරයි.
02) ආලෝක ශක්තිය, විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කරයි.
03) තාප ශක්තිය, ආලෝක ශක්තිය බවට පරිවර්තනය කරයි.
04) සූර්ය ශක්තිය, ආලෝක ශක්තිය බවට පරිවර්තනය කරයි.
05) විකිරණය ආලෝක ශක්තිය බවට පරිවර්තනය කරයි.



Scanned by CamScanner

15. මෙහි දැක්වෙන රූපය දෙස A දිශාවේ සිට බැලූ විට, ප්‍රථම කෝණ ප්‍රක්ෂේපණ මූලධර්මය අනුව, එහි උලසුම ඉදිරි පෙනුම හා අන්ත පෙනුම දැක්වෙන රූපය තෝරන්න.







16. ගෙයින් ගෙට ගොස් ලේන්සු සහ කොට්ට උර අලෙවි කළ පුද්ගලයකුගේ ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණු වී ඔහු අද විශාල පරිමාණයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවක හිමිකරුවෙකි. ව්‍යාපාරයට ආධාර කළ රාජ්‍ය හා වාණිජ බැංකු විසින් මෙම පුද්ගලයා විශ්වාසවන්ත ගනුදෙනුකරුවකු ලෙස හඳුනාගෙන ඇත. සාර්ථක ව්‍යවසායකුගේ ගති ලක්ෂණ පෙන්වා දෙන පිළිතුර තෝරන්න.

01) අධිෂ්ඨානය, බැංකු සමග ගනුදෙනු කිරීම, අලෙවිකරණය හා ණයගැතියකු වීම.
02) අධිෂ්ඨානය, කැපවීම, කළමණාකරණය හා විශ්වාසවන්ත වීම
03) කුඩා පරිමාණයෙන් ආරම්භ කිරීම වාණිජ බැංකුකරණය, ව්‍යාපාර පිළිබඳ දැනුම ලබාගැනීම හා ස්වයං අලෙවිකරණය
04) කුඩා පරිමාණයෙන් ආරම්භ කිරීම, ප්‍රාග්ධන ආයෝජන නොසලකා හැරීම ස්වයං අලෙවිකරණය හා බැංකු ණය ලබාගැනීම.
05) බැංකු ණය ලබානොගැනීම, කුඩා පරිමාණයෙන් ආරම්භ කිරීම, ස්වයං කළමණාකරණය හා ස්වයං අලෙවිකරණය

17. නවීන ශීතකරණවල ශීතකාරක CFC (ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන්) රහිත ය. මෙයට හේතුව වනුයේ,

01) ශීතකරණ ගුණ හිනවීම හා එබැවින් සිසිලන බලපෑම මදවීම ය.
02) සෑම කෙනෙකුටම මිලදී ගත හැකි වන පරිදි ශීතකරණවල පිරිවැය පහළ දැමීම ය.
03) අධික වායුගෝලීය උෂ්ණත්වය නිසා සිසිලනය අකාර්යක්ෂම වීමය.
04) ඕසෝන් ස්ථරය ක්ෂයවීම වැළැක්වීමය.
05) විදුලි පරිභෝජන ගාස්තු අඩු කිරීම තුළින් ශීතකරණ සඳහා තරගකාරී ඉල්ලුමක් ඇති කිරීමය.

18. මගී බසයක් නිශ්චලතාවයෙන් ගමන් අරඹා එහි ප්‍රවේගය $40\,kmh^{-1}$ ට ළඟා වන තෙක් ඒකාකාරව ත්වරණය වෙයි. මෙම චලිතය විස්තර කෙරෙන ප්‍රස්තාරය තෝරන්න.




19. මිනිසෙක් $30\ kmh^{-1}$ ඒකාකාර වේගයෙන් බයිසිකලයක් පදී. ඔහු මිනිත්තු 20 කදී කොපමණ දුර ගමන් කරයිද?

01) 100 m 02) 150 m 03) 1.5 km 04) 10 km 05) 60 km

20. පහත සඳහන් සංකේතය මගින් දැක්වෙන උපාංගය කුමක්ද?

01) JEET
02) BJT
03) UJT
04) MOSFET
05) TRAIAC



Scanned by CamScanner

[illegible] කර ඇත් විට වාහනය තුළ ඇති විදුලි බුබුල දැල්විය යුතුය. මෙම ක්‍රියාවලිය සඳහා යෙදිය හැකි තාර්කික ද්වාරය කුමක්ද?



01) OR
02) AND
03) XOR
04) NOR
05) NAND

22. පරිපථයට අනුව ES විභව ප්‍රභවයේ තිබිය යුතු විභවයේ අගය කුමක්ද?




01) 40 V
02) 90 V
03) 200 V
04) 230 V
05) 280 V

23. වර්ධකයක් ලෙස යොදා ගැනීමේ දී ද්විධ්‍රැව සන්ධි ට්‍රාන්සිස්ටරයක (BJT)- P-N සන්ධි දෙකෙහි නැඹුරුව තිබිය යුත්තේ,
01) සන්ධි දෙකම පෙර නැඹුරු වන ලෙස ය.
02) සන්ධි දෙකම පසු නැඹුරු වන ලෙස ය.
03) BE සන්ධිය පෙර නැඹුරු හා BC සන්ධිය පසු නැඹුරු වන ලෙස ය.
04) BE සන්ධිය නැඹුරු හා BC සන්ධිය පෙර නැඹුරු වන ලෙසය.
05) BC සන්ධිය පසු නැඹුරු වී BE සන්ධිය නොනැඹුරුව පවතින ලෙසය.

24. පහත දැක්වෙනුයේ ප්‍රතිදීප්ත පහනක විදුලි ඇඳුම් පරිපථය සඳහා අවශ්‍ය උපාංගයන් ය.




*L* - Live
*N* - Neutral

පරිපථය සඳහා නිවැරදි කම්බි ඇඳුම් පිළිවෙල වන්නේ,
01) L → S → $P_1$ → $P_2$ → C → N
02) L → C → $P_1$ → S → $P_2$ → N
03) L → S → C → $P_1$ → $P_2$ → N
04) L → C → S → $P_1$ → $P_2$ → N
05) L → $P_1$ → C → S → $P_2$ → N

25. විදුලිබල සම්ප්‍රේෂණය හා බෙදාහැරීම පිළිබඳ පහත සඳහන් වගන්ති සලකන්න.
A- විදුලිබල සම්ප්‍රේෂණයේදී 33,000V හෝ 11,000V වන විභව ප්‍රමාණයන් උදාසීන හා සජීව කම්බි අතර පිහිටයි.
B- විදුලිය බෙදාහැරීමේදී 230 V විභවය ශ්‍රී ලංකාවේ සම්මත එකලා විභවය ලෙස භාවිතා වේ.
C- සම්ප්‍රේෂණය සඳහා භාවිත වන රැහැන් නිතරම බර හා හරස්කඩ විෂ්කම්භය වැඩි සන්නායක වේ.
D- තෙකලා විභව ඉල්ලුමකදී නිවාස විදුලි සැපයුම් සඳහා 11,000V විභවය ලබා නොදීම විදුලිබල මණ්ඩලයේ වගකීමයි.

ඉහත වගන්ති සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
01) A අසත්‍ය ය.
02) B අසත්‍ය ය.
03) C අසත්‍ය ය.
04) D අසත්‍ය ය.
05) A,B,C හා D යන සියල්ලම අසත්‍ය ය.



Scanned by CamScanner

26. රූපයේ දැක්වෙන ද්වාර පරිපථයේ Q සඳහා වන ප්‍රතිදානය වනුයේ,




01) 0000 02) 0001
03) 1000 04) 0101
05) 1111

27. රූපයේ දැක්වෙන පරිපථය අනුව R ප්‍රතිරෝධය හරහා තිබිය යුතු විභව තරංගයේ හැඩය කුමක්ද?







28. පාසල් උත්සවයකදී වේදිකාව ආලෝක කිරීම ඔබ පන්තියට පැවරී ඇත. මේ සඳහා 6 A විලායකයක් හා එක යතුරක් (switch) ද, 300 W බල්බ කිහිපයක් ද ඔබට ලැබේ. විලායකය නොදැවී ක්‍රියාකිරීම සඳහා ඔබට යොදා ගත හැකි උපරිම බල්බ ගණන කීයද?

01) 3 02) 4 03) 5 04) 20 05) 50

29. සුඛෝපභෝගී විද්‍යාවට (Ergonomics) අනුව යන්ත්‍රයක් සැලසුම් කිරීමේ දී වැදගත් නොවන්නේ කුමක්ද?

01) මිනිසාගේ නිශ්චල මිනුම් (static measurements)
02) මිනිසාගේ චලිත ඉරියව්වල ඇති මිනුම් (dynamic measurements)
03) සේවකයකුගේ වැඩ කරන ඉරියව්ව
04) යන්ත්‍රය මගින් කුමන ආකාරයේ භාණ්ඩයක් නිපදවයි ද යන බව (type of product)
05) පාලන උපාංගවල (controls) හා ප්‍රදර්ශකවල (displays) පිහිටීම

30. තම දෛනික ජීවිතයේ කාර්යයන් පහසු කරගැනීම සඳහා මිනිසා විසින් විවිධාකාර විශිෂ්ට නිපුණ මෙවලම් (artifacts) නිපදවා ඇත. ඔබට නිපුණ මෙවලමක් සැලසුම් කිරීමට අවශ්‍යව ඇත්නම් එය සැලසුම් කිරීමට අදාළව ගත යුතු පළමු පියවර වන්නේ,

01) භාණ්ඩය විකිණීමෙන් පසු ලැබෙන ලාභය පිළිබඳ සලකා බැලීම ය.
02) භාණ්ඩයේ දළ සටහනක් ඇඳීම ය.
03) භාණ්ඩයේ ඇති අවශ්‍යතාව හඳුනාගැනීම හා අවබෝධ කර ගැනීමය.
04) භාණ්ඩ නිපදවීමට අවශ්‍ය ද්‍රව්‍ය තෝරා ගැනීමය.
05) භාණ්ඩයේ මිනුම ගණනය (overall dimensions) කිරීමය.

31. නිෂ්පාදන ක්‍රියාවලියේ දී ලිස්සුම් ආමානය (Slip gauge) භාවිත කෙරෙනුයේ,

01) දිග මනින උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා ය. 02) දිග මැනීම සඳහා ය.
03) කෝණ මැනීම සඳහා ය. 04) කෝණ මනින උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා ය.
05) ඝර්ෂණ සංගුණකය නිර්ණය කිරීම සඳහා ය.

32. මිලින් මැෂිමක ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

01) මිලින් මැෂින් තිරස් හා සිරස් යන ආකාරවලින් පවතී.
02) මිලින් මැෂිමක ආධාරයෙන් ඉස්කුරුප්පුවක පොටවල් කැපිය හැකිය.
03) මිලින් මැෂිමක ආධාරයෙන් ගියරක දැති කැපිය හැකි ය.
04) මිලින් මැෂිමක ආධාරයෙන් ලෝහ මතුපිටක නිමැවුම දියුණු කළ හැකිය.
05) සිරස් වර්ගයේ මිලින් මැෂිමක හිස ඇළ කළ හැකිය.



Scanned by CamScanner

33. රිවට් හා ඉස්කුරුප්පු මගින් එකලස් කිරීමේ ක්‍රියාවලිය, වෙල්ඩිම් ක්‍රමවේදය සමග සැසඳීමේදී අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

01) වෙල්ඩිම් කිරීමට මනා පුහුණුවක් හා නිපුණතාවක් අවශ්‍ය වේ.

02) දෝෂ ඇතිවීමට ඇති ඉඩකඩ වැඩි නිසා එහි අඩු විශ්වාසනීයත්වයක් පවතින අතර පුරෝකථනය කිරීම ද අපහසුය.

03) දෝෂ සහිත කොටස් වෙනුවට අලුත් කොටස් එක් කිරීමේ දී හෝ වෙන්කිරීම පසුවට සිදු කරනු ලබන අවස්ථාවල දී වෙල්ඩිම් ක්‍රමවේදය සුදුසු වේ.

04) තුනී තහඩු වෙල්ඩිම් කිරීම අපහසු වන අතර ඒ සඳහා අධික මුදලක් වැය වේ.

05) වෙල්ඩිම් ක්‍රමවේදයේ දී නිකුත් වන හානිකර දුම් හා ආලෝකය වෙල්ඩිම්කරුට අහිතකර වන අතර, එයින් ආරක්ෂා වීම අවශ්‍ය වේ.

34. ඉංජිනේරු සැලසුම් චිත්‍රවල මෙට්‍රික් ඉස්කුරුප්පු පොට M10 x 2 ආකාරයෙන් හඳුන්වා ඇත. මෙම සම්මත ක්‍රමය මගින් දෙනු ලබන තොරතුරු මොනවාද?

01) අන්තරාල වෘත්තයේ විෂ්කම්භය 10mm අන්තරාලය 2mm

02) අන්තරාල වෘත්තයේ විෂ්කම්භය 10mm උපරිම විෂ්කම්භය 12mm

03) අන්තරාල වෘත්තයේ විෂ්කම්භය 20mm අන්තරාලය 2mm

04) අන්තරාල වෘත්තයේ විෂ්කම්භය 20mm උපරිම විෂ්කම්භය 12mm

05) අන්තරාල වෘත්තයේ විෂ්කම්භය 10mm අන්තරාලය 5mm

35. පහත සම්බන්ධතා අතුරෙන් තාපගතික විද්‍යාවේ ප්‍රථම මූලධර්මය සම්මත ආකාරයෙන් දක්වනු ලබන නිවැරදි සම්බන්ධතා තෝරන්න. Q යනු තාපය ද, U යනු එන්ට්‍රොපිය ද, W යනු කාර්යය ද වේ.

01) $\Delta Q = \Delta U + \Delta W$ 02) $\Delta Q > \Delta U + \Delta W$ 03) $\Delta Q = \Delta U + \Delta W$

04) $\Delta W = \Delta U + \Delta Q$ 05) $\Delta U = \Delta W + \Delta Q$

36. සනකම් GI දඬු දෙකක් එකිනෙකට සම්බන්ධ කිරීමට භාවිත කළ හැකි වඩාත් සුදුසු ක්‍රමය කුමක් ද?

01) මෘදු පෑස්සීම (Soft soldering) 02) වායු වෙල්ඩිම (Gas welding)

03) විද්‍යුත් චාප වෙල්ඩිම (Arc welding) 04) තිත් වෙල්ඩිම (Spot welding)

05) හැඩ තැලීම (Forging)

37. පාලන පද්ධතිවල අදාල ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- ද්විත්ව ලෝහය, උෂ්ණත්ව පුඩු පාලන පද්ධතියක භාවිත කරනු ලබන සරල පාලකයකි.

B- සංවෘත පුඩු පාලන පද්ධතිය සැම විටම ප්‍රතිපෝෂක මාර්ගයකින් සමන්විත වේ.

C- විදුලි ඉස්තිරික්කය විවෘත පුඩු පාලන පද්ධතියට උදාහරණයකි.

D- මිනිසාගේ මැදිහත්වීම, මානව සංවෘත පුඩු පාලන පද්ධතියක (manual closed loop control system) ක්‍රියාකාරිත්වය සඳහාඅවශ්‍ය වේ.

මින් නිවැරදි වනුයේ,

01) A,B හා C පමණි 02) B,C හා D පමණි 03) C,D හා A පමණි

04) D,A හා B පමණි 05) A,B,C හා D යන සියල්ලම ය.

38. යන්ත්‍රයක දක්ෂිණාවර්තව භ්‍රමණය වන උපාංගයක් ඉස්කුරුප්පුවකින් තද කිරීමේ එය බුරුල් නොවන්නේ,

01) වාමාවර්ත ඉස්කුරුප්පු පොටක් මගින් තද කළ විට ය.

02) දුනු වොෂරයක් යොදා තද කළ විට ය.

03) ටැබ් වොෂරයක් යොදා අගුල් දමා තද කළ විට ය.

04) අගුල් මුරිච්චියක් යොදා තද කළ විට ය.

05) පැතලි වොෂරයක් යොදා තද කළ විට ය.



Scanned by CamScanner

39. තිරස් නළයක් තුළින් තරලයක් X පිහිටුමේ සිට Y පිහිටුම දක්වා ගලා යන ආකාරය රූපයෙන් දක්වා තිබේ. එහි P මගින් පීඩනය ද, V මගින් ප්‍රවේගය ද, Z මගින් ආරෝහණය ද පිළිවෙලින් දක්වා ඇත. X පිහිටුමේ හා Y පිහිටුමේ ඇති වේගය හා පීඩනය අතර සම්බන්ධතාව නිවැරදිව දක්වනු ලබන පිළිතුර තෝරන්න.




01) $V_Y > V_X$ සහ $P_X < P_Y$
02) $V_Y > V_X$ සහ $P_X > P_Y$
03) $V_Y > V_X$ සහ $P_X < P_Y$
04) $V_Y < V_X$ සහ $P_X > P_Y$
05) $V_Y > V_X$ සහ $P_X = P_Y$

40. කේන්ද්‍රාභිසාරී පොම්ප පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- කේන්ද්‍රාභිසාරී පොම්ප, යාන්ත්‍රික ශක්තිය තරල ප්‍රවාහයේ ඇති ශක්තිය බවට හරවයි.

B- කේන්ද්‍රාභිසාරී පොම්ප, අඩු ප්‍රවාහයක් (flow) ලබාගැනීමට සුදුසු වේ.-

C- කේන්ද්‍රාභිසාරී පොම්පවල ඉම්පිලරය (impeller) දැකිය හැකි අතර, එය පෙතිවලින් (vanes) සමන්විත වේ

D- කේන්ද්‍රාභිසාරී පොම්ප ඉහ ශක්තියක් (high delivery head) ලබාගැනීමට අවශ්‍ය වූ විට සුදුසු වේ.

මින් නිවැරදි වනුයේ,

01) A හා B පමණි
02) A හා C පමණි
03) A,B හා C පමණි
04) B,C හා D පමණි
05) C,D හා A පමණි

41. මෝටර් රථයක ජව පද්ධතියට අයත් උපාංගය තෝරන්න.

01) දඟර දුන්න (coil spring)
02) ගැස්සුම් නිවාරකය (shock absrber)
03) ආන්තරය (differential)
04) ව්‍යාවර්තන දණ්ඩ (torsion bar)
05) ආනතික දණ්ඩ (tie rod)

42. සම්පීඩන ජ්වලන (Compression Ignition) එන්ජිමක උපාංගයක් නොවන්නේ කුමක්ද?

01) ඉන්ධන විදිනය (injector)
02) අවකරය (throttle body)
03) චූෂණ වෑල්වය (intake valve)
04) පිටාර වෑල්වය (exhaust valve)
05) විදුම් පොම්පය (injector pump)

43. අභ්‍යන්තර දහන එන්ජින් හා සම්බන්ධ ප්‍රකාශ හතරක් පහත දැක්වේ.

A- ඩීසල් එන්ජින් තත්වයෙන් අඩු මිශ්‍රණ (lean mixtures) මගින් ක්‍රියා කරයි.

B- ඩීසල් එන්ජින් මගින් ද්විත්ව පහර ගෑසොලින් එන්ජින්වලට වඩා දහනය නොවූ හයිඩ්‍රොකාබන් වායු (hydro carbons) මුදා හරී.

C- ගෑසොලින් එන්ජින්, ඩීසල් එන්ජින්වලට වඩා කාර්යක්ෂම වේ.

D- චූෂණ පහර තුළදී වායු හා ඉන්ධන මිශ්‍රණය සිලින්ඩරය තුළට උරා ගැනීම ඩීසල් එන්ජින්වල දී සිදුවේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

01) A පමණි
02) A හා B පමණි
03) B හා C පමණි
04) B හා D පමණි
05) B,C හා D පමණි



Scanned by CamScanner

44. ගියර පෙට්ටිය, මෝටර් රථයක ජව පද්ධතියට අයත් වැදගත් උපාංගයකි. ගියර පෙට්ටිය/භාවිත කරනු ලබන්නේ

A- ජවය වැඩි කිරීමට ය.
B- වේගය හා ව්‍යාවර්තය වෙනස් කිරීමට ය.
C- රෝද භ්‍රමණය වන දිශාව වෙනස් කිරීමට ය.
D- බැටරිය දුර්වල වූ විටෙක දී තල්ලු කිරීම මගින් පණ ගැන්වීමටය.

මින් සත්‍ය වනුයේ,

01) A හා B පමණි
02) A හා C පමණි
03) B හා C පමණි
04) A,C හා D පමණි
05) A,B,C හා D යන සියල්ල මය.

45. ඩීසල් එන්ජිමක් අනෙක් වර්ගයේ එන්ජින්වලින් වෙන් කොට හඳුනාගැනීම සඳහා යොදාගත හැකි වඩාත් සුදුසු ලක්ෂණය කුමක්ද?

01) ස්ටාටර් මෝටරයේ ඇති පිහිටුම
02) එන්ජිමේ විශාලත්වය
03) ඉන්ධන සැපයුම් පද්ධතියේ සැකැස්ම
04) වැල්ව සංඛ්‍යාව
05) පිටාර පද්ධතිය (Exhaust system)

46. පොරකටු ගියරයක දැති (spur gear teeth) කැපීම සඳහා යොදා ගත හැකි යන්ත්‍රය කුමක්ද?

01) ලියවන පට්ටලය (lathe machine)
02) හැඩගාන යන්ත්‍රය (shaping machine)
03) මිලින් යන්ත්‍රය (milling machine)
04) විදුම් යන්ත්‍රය (drilling machine)
05) සෑරුම් යන්ත්‍රය (boring machine)

47. තුනී තහඩු යොදා ගැනීම මගින් යන්ත්‍රයක් සඳහා තෙල් ළිඳක් (oil sump) සැකසීමට අවශ්‍යව ඇත. තෙල් ඉහළ උෂ්ණත්වයකට ලක්වන්නේ නම් එම තෙල් ළිඳේ ඇති තහඩු සම්බන්ධ කිරීමට යොදාගත හැකි ක්‍රමය තෝරන්න.

01) ඉස්කුරුප්පු ඇණ යෙදීම
02) රිවට් ක්‍රමය
03) ඇලවීම
04) වායු වෙල්ඩිම් ක්‍රමය
05) විද්‍යුත් චාප වෙල්ඩිම් ක්‍රමය

48. ද්‍රව සම්ප්‍රේෂණ පද්ධතියක් (hydraulic power transmission) මගින් ලබාදෙන බලය වැඩිකිරීම සඳහා යොදා ගත හැකි වඩාත් සුදුසු කුමක්ද?

01) ඇතුළත සිලින්ඩරයේ විෂ්කම්භය පිටත සිලින්ඩරයේ විෂ්කම්භයට වඩා වැඩි කිරීම
02) පිටත සිලින්ඩරයේ විෂ්කම්භය ඇතුළත සිලින්ඩරයේ විෂ්කම්භයට වඩා වැඩි කිරීම
03) පිටත සිලින්ඩරය හා ඇතුළත සිලින්ඩරය අතර ඇති දුර ප්‍රමාණය අඩු කිරීම
04) හයිඩ්‍රොලික් ද්‍රව රැඳවුම් පරිමාව වැඩි කිරීම
05) අඩු දුස්ස්‍රාවිතාවක් ඇති තරලයක් භාවිත කිරීම

49. විසර්ජන වීමේ වේගය කුමක් වුවත්, බැටරියක සම්පූර්ණ ආරෝපණය එහි සාමාන්‍ය විභවය යටතේ තිබේ යැයි උපකල්පනය කළහොත් සම්පූර්ණයෙන් ආරෝපණය වී ඇති 100 Ah, 12 V බැටරියකින් ලබාගත හැකි ශක්තිය කොපමණද?

01) 1.2 kWh
02) 1.44 kWh
03) 8.33 kWh
04) 12 kWh
05) 100 kWh

50. ප්‍රතිසම (analog) මිනුම් උපකරණවලට වඩා සංඛ්‍යාංක (digital) මිනුම් උපකරණවල ඉහළ යමින් පවතී. පහත දැක්වෙන කවරක් සංඛ්‍යාංක මිනුම් උපකරණ භාවිතය ඉහළ යාමට හේතුවක් නොවූයේ ද?

01) සංඛ්‍යාංක උපකරණවල ප්‍රතික්‍රියා කාලය ප්‍රතිසම උපකරණවලට සාපේක්ෂව ඉතා පහළ අගයක් ගැනීම.
02) සංඛ්‍යාංක උපකරණවල පමණක් ස්වයං පරාස පහසුකම තිබීම
03) සංඛ්‍යාංක උපකරණ පහසුවෙන් දත්ත ජාල (data networks) හා සම්බන්ධ කළ හැකි වීම.
04) සංඛ්‍යාංක උපකරණ විද්‍යුත් ඝෝෂාවලට ඉහළ ප්‍රතිරෝධයක් දැක්වීම
05) චලනය වන අංග නොමැති නිසා සංඛ්‍යාංක උපකරණ සාමාන්‍යයෙන් ප්‍රමාණයෙන් කුඩා වීම.


Scanned by CamScanner

01. ප්‍රවේගයේ හා ත්වරණයේ සම්මත ඒකක පිළිවෙලින් නිරූපණය වන පිළිතුර කුමක්ද?

01. $m s m s^{-2}$ 02. $Ns, Nm s^{-2}$ 03. $s^{-1}, m s^{-2}$
04. $m s^{-1}, m s^{-2}$ 05. $Nm^{-1}, Nm$

02 හා 03 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සංසිද්ධිය උපයෝගී කරගන්න. පහත රූපයෙ දක්වා ඇත්තේ සර්වසම (identical) මෝටර් රථයක් X හා Y යන බෑවුම් ඔස්සේ ගමන් ගන්නා අයුරුය. මෙහි X හි බෑවුම Y ට වඩා වැඩිය. P සිට Q ට ඇති දුර බෑවුම් දෙකෙහිම එක සමාන වේ. බෑවුම් දෙකෙහි ඇති P ලක්ෂයේ දී මෝටර් රථයේ ප්‍රවේගය එකම වේ. P ලක්ෂයේ දී රියදුරා ත්වරකයෙන් (accelerator) ඔහුගේ පාදය ඉවතට ගෙන ඇතැයි උපකල්පනය කරන්න.




02. පහත දක්වා ඇති ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය කුමක්ද?

01) බෑවුම් දෙකෙහි දීම මෝටර් රථය Q ලක්ෂ්‍යයට ළඟාවීමට සමාන කාලයක් ගනී.
02) X බෑවුමේදී මෝටර් රථය ඉක්මනින් Q ලක්ෂ්‍යයට ළඟා වේ.
03) Y බෑවුමේදී මෝටර් රථය ඉක්මනින් Q ලක්ෂ්‍යයට ළඟා වේ.
04) මෝටර් රථය Q ලක්ෂ්‍යයට පෙර නතර වේ.
05) මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අවශ්‍ය තරම් තොරතුරු සපයා නැත.

03. බෑවුම් දෙකෙහි ඇති Q ලක්ෂ්‍යයේදී රියදුරාට මෝටර් රථය නැවැත්වීමට අවශ්‍යව ඇත. ඔහු පහත සඳහන් විකල්ප දක්වා ඇත.

A- X සහ Y යන බෑවුම්වල ඇති P ලක්ෂ්‍යයේදී සමාන රෝධක බලයක් යෙදීම
B- P ලක්ෂ්‍යයේදී Y බෑවුමට වඩා වැඩි රෝධක බලයක් X බෑවුමේදී යෙදීම
C- X බෑවුමේදී P හා Q ලක්ෂ්‍යවල මධ්‍යයේදී වැඩි රෝධක බලයක් යෙදීම හා Y බෑවුමේ P ලක්ෂ්‍යයේදී සාධාරණ (reasonable) රෝධක බලයක් යෙදීම.

Q ලක්ෂ්‍යයේදී මෝටර්රථය නැවතීමට ඉහත ඇති විකල්පවලින් ඉතා යෝග්‍ය ක්‍රියමාර්ගය/ ක්‍රියාමාර්ග වන්නේ,

01) A පමණි 02) C පමණි 03) A හා B පමණි
04) B හා C පමණි 05) A,B හා C යන සියල්ලම

04. ඔබ බස්රථයක ගමන් කරන අතරතුර රියදුරා විසින් ක්ෂණිකව තිරිංග ක්‍රියාත්මක කළා යැයි සිතන්න. මෙම සංසිද්ධියේ ප්‍රතිඵලයක් ලෙස ඔබට අත්දැකීමට සිදුවන දේවල් ඇසුරින් ඉතාම සුදුසු අත්දැකීම් දැක්වෙන්නේ පහත සඳහන් කුමකින්ද?

01) ඔබගේ ගම්‍යතාව බස්රථයේ ගම්‍යතාවට වඩා අඩු බැවින් ඔබව ඉදිරියට විසි වීමක් සිදුවේ.
02) බස් රථයේ වේගයට සමාන වේගයකින් ඔබ ද ගමන් ගන්නා බැවින් ඔබව ඉදිරියට විසිවේ.
03) ඔබගේ ගම්‍යතාව බසයේ ගම්‍යතාවට වඩා වැඩි බැවින් ඔබව ඉදිරියට විසිවේ.
04) ඔබගේ හා රථයේ ගම්‍යතාව සමාන බැවින් මෙහි දී ඔබව ඉදිරියට විසිවේ.
05) ඔබ රථයට වඩා බර අඩු බැවින් ඔබව ඉදිරියට විසිවේ.

05. මෙම රූපසටහන්වලින් පෙන්නුම් කරන්නේ එකම ද්‍රව්‍යයක් බඳුන් පහතට දමා ඇති ආකාරයයි. බඳුන පතුලෙහි දී ඇති වන පීඩනය (P) පිළිබඳ ව දක්වා ඇති ඉතාම සුදුසු පිළිතුර කුමක්ද?




01) A බඳුනේ පතුලෙහි පීඩනය C බඳුනේ පතුලෙහි පීඩනයට වඩා අඩුය.
02) A හා E බඳුන්වල පතුලෙහි පීඩන සමාන වේ.
03) B බඳුනේ පතුලේ පීඩනය D බඳුනේ පතුලේ පීඩනයට වඩා වැඩිය.
04) පිළිවෙලින් එක් එක් බඳුනේ පතුලෙහි පීඩනය B,D,A,E,C යන ආකාරයට අඩු වේ.
05) සියලුම බඳුන්වල පතුලෙහි පීඩන සමාන වේ.



Scanned by CamScanner

A- අමු තෙල් (crude oil) විඝටනය සහ ආසවනය කිරීමෙන් පෙට්‍රල් ද්‍රාව්‍ය ඉන්ධනයකි.

B- විවිධ වාෂ්පශීලි හයිඩ්‍රෝ-කාබන්වලින් පෙට්‍රල් සමන්විත වේ.

C- අමු තෙල් විඝටනයේ දී ඊයම් නිපදවේ.

D- පිටාර පද්ධතිවල (exhaust system) උත්ප්‍රේරක පරිවර්තක (catalytic converter) සවිකර ඇති අතර එමගින් කාබන් මොනොක්සයිඩ් අපද්‍රව්‍යයක් ලෙස පරිසරයට පිට කෙරේ.

| | | |
|---|---|---|
| 01) A හා B පමණි | 02) B හා C පමණි | 03) A,B හා C පමණි |
| 04) A,B හා D පමණි | 05) A,B,C හා D යන සියල්ලම | |

08. පොසිල ඉන්ධන දහනය ආම්ලික වැසි ඇති වීමට හේතු වේ.

A- පොසිල ඉන්ධන දහනයේදී අතුරු ඵල ලෙස N හා S ඔක්සයිඩ් නිපදවේ.

B- ආම්ලික වැසි මගින් මතුපිට පසෙහි හා මිරිදිය ජලාශවල ආම්ලිකතාව වැඩි කෙරෙයි.

C- වායුමය අපවිත්‍රකාරක භූගෝලීය හා දේශපාලනීය මායිම් හරහා ගමන් කළ හැකිය.

D- කිරිගරුඬ ආම්ලික වැසි සමග ප්‍රතික්‍රියා කර ඛාදන ක්‍රියාවලිය ඉක්මන් කරයි.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

| | | |
|---|---|---|
| 01) A හා B පමණි | 02) B,C හා D පමණි | 03) A,B හා C පමණි |
| 04) A,B හා D පමණි | 05) A,B,C හා D යන සියල්ලම | |

09. වායව ටයර (Pneumatic tyres) බයිසිකලයේ සිට බර වාහනය දක්වා යොදා ගනී.

A- රබර් ටයර රළු පෘෂ්ඨයක් මත ගැටීමේදී ශක්තිය අවශෝෂණය කරයි. මෙහි දී ටයරය ප්‍රත්‍යාස්ථ විරූපණයකට බඳුන් වේ.

B- රළු මාර්ගවල ගමන් කිරීමේදී ටයරයට දැරිය හැකි උපරිම පීඩනයට හුළං පිරවීම අවශ්‍ය වේ.

C- හුළං පිරවූ ටයරයක් දිගු දුරක් ගමන් කිරීමේදී රත් වීමක් සිදු නොවේ.

D- ආමානයක පීඩනය 28 psi ලෙස දැක්වෙන්නේ වායුගෝලීය පීඩනයට සාපේක්ෂවය.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

| | | |
|---|---|---|
| 01) A හා B පමණි | 02) A හා C පමණි | 03) A හා D පමණි |
| 04) A,B හා C පමණි | 05) A,B හා D පමණි | |

10. ප්ලාස්ටික් නිපැයුම් පරිහරණය විශාල ඉහළ යාමේ ප්‍රවණතාවක් මෑත කාලයෙහි දක්නට ඇත.

A- අමු තෙල පරිභෝජනය ඉහළ යාම

B- ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ හැකියාව

C- ශක්තිය, කල්පැවැත්ම හා අවශ්‍ය හැඩවලට සාදාගැනීමට ඇති හැකියාව

D- අඩු නිෂ්පාදන පිරිවැය

මුලින් දැක්වූ ප්‍රවණතාවයට හේතු දක්වන්නේ ඉහත ප්‍රකාශ අතුරෙන්

| | | |
|---|---|---|
| 01) C හා D පමණි | 02) A,B හා C පමණි | 03) A,C හා D පමණි |
| 04) B,C හා D පමණි | 05) A,B,C හා D යන සියල්ලම | |

11. වර්තමානයේ ශක්තිය ලබාගැනීමට වැඩියෙන් ම යොදාගන්නා ප්‍රභවය තෝරන්න.

| | | |
|---|---|---|
| 01) සූර්යයා හා චන්ද්‍රයා | 02) සූර්යයා | 03) සූර්යයා හා න්‍යෂ්ටික බලය |
| 04) පොසිල ඉන්ධන හා සුළඟ | 05) පොසිල ඉන්ධන | |



Scanned by CamScanner

12. සිව් පහර එන්ජිමක පරිපූර්ණ චක්‍රයක් සඳහා සම්පූර්ණ කළ යුතු පහර අනුපිළිවෙල වන්නේ,

01) සම්පීඩක හා බල පහරය.
02) සම්පීඩක, බල පහර හා පිටකර පහරය.
03) ඇතුළුකර, සම්පීඩක, බල හා පිටකර පහරය.
04) සම්පීඩක, පිටකර ඇතුළුකර හා බල පහරය
05) බල, ඇතුළුකර, පිටකර හා සම්පීඩක පහරය.

13. රූපයේ දක්වා ඇත්තේ වර්නියර කැලිපරයකින් මිනුම් ගන්නා අන්දමයි. එහි නිවැරදි කියවීම වන්නේ,




01) 755 ය.
02) 756 ය.
03) 765 ය.
04) 766 ය.
05) 760 ය.

